කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2013

මගේ අංකය : DMS/Cir/2013/Bonus
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01 .
2013. 11. 15 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් /රාජ්‍ය සංස්ථා හා
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට**
**2013 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම**

**1. ප්‍රසාද දීමනා ගෙවීම**

2013 වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට පහත සඳහන් පරිදි ප්‍රසාද දීමනා ගෙවීම 2013.10.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත කර ඇත.

| ආයතනයේ වර්ගය | යෝජිත ප්‍රසාද දීමනාව |
|---|---|
| අදාල මුදල් වර්ෂය තුළ ලාභ උපයාගෙන ඇති නමුත් වෙනත් දිරිකාරක ගෙවනු නොලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.10,000/- x 25%<br>රු.12,500/- |
| පැමිණීම හා කාර්ය සාධනය පදනම් කරගත් දිරිකාරක හෝ වෙනත් ආකාරයක දිරිකාරක **ගෙවන්නේ නම්,** එවැනි ලාභ ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.7,500/- x 25%<br>රු.9,375/-<br>රු.9,500/-<br>(ආසන්න වශයෙන්) |
| පාඩු ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.1,000/- |
| පසුගිය වසරට වඩා පාඩු අඩු කරගෙන ඇති රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.2,000/- x 25%<br>රු.2,500/- |

**2.** 2013 මුදල් වර්ෂය තුළ පාඩු ලබා ඇති රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීමට ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගත යුතුය. මේ සඳහා වන ඉල්ලීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අදාල අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය.

3. අනුගමනය කළ යුතු පිළිවෙල

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටෙක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

3.3 ඉහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාල රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වාර්ෂික ගිණුම් 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/21 ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

4. විශේෂ කරුණු

4.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන සංස්ථා හා රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

4.3 මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට පරිබාහිර කිසියම් ප්‍රසාද දීමනාවක් ගෙවන්නේ නම්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

5. පැහැදිලි කර ගැනීම

මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව / රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසන ලෙස කාරුණිකව දන්වමි.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

<u>පිටපත් :</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව